# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 8,872—1942ක්වූ පෙබරවාරි මස 27 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඩ්ග නීති.

**වසූරිය ගමන් පිළිබඳ ආඥාපනත.**

**සන්නාසා මඩගලායය සම්බන්ධ ව්‍යවස්ථා.**

1942 මාර්තු මස සන්නාසා මඩගලායය සඳහා තලවිල්ලුවට සිරිත්පරිදි කෙරෙන වන්දනාගමනය උදෙසා, (133වෙනි පරිච්ඡේදය වන) වන්දනාගමන් ආඥාපනතෙහි 2වෙනි වගන්තියෙන් ලත් බලය ප්‍රකාර, ලංකාණ්ඩුකාරතුමා වන ඇන්ඩ්‍රූ කොල්ඩිකොට් නමැති මම, මෙම දැන්වීමෙන් පහත දැක්වෙන ව්‍යවස්ථා පනවමි.

ඒ. කොල්ඩිකොට්,
ආණ්ඩුකාරතුමා.

මම 1942ක්වූ පෙබරවාරි මස 24වෙනි දින
කොළඹදීය.

**ව්‍යවස්ථා.**

1. මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමිය" යන්නෙන් හඟවන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමාතුළ පිහිටි භූමිභාගයයි. "උප දිසාපතිතුමා" යන්නෙන් හඟවන්නේ පුත්තලම පළාතේ උප දිසාපතිතුමාය.

2. උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් ලැගුම්භූමිය තුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම්ගතයුතු නොවේ.

3. ශරීරකෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන්කිසි තැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

5. (a) මැරීම පිණිස ලැගුම්භූමියට ගෙනෙනලද ගවයන් හා උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් එබඳු භූමියෙහි තබාගැනීමට අවසර දෙනලද ගවයන් හැර අන්කිසි ගවයකු ලැගුම්භූමියෙහි තබාගෙන යුතුයි.

(b) උප දිසාපතිතුමා විසින් ගවගාලක් වශයෙන් විශේෂයෙන් නියමකරනලද තැනක හෝ ඒ කටයුත්තට යෙදීම පිණිස එතුමා විසින් අනුමතකරනලද තැනක හැර ලැගුම්භූමියට සමීපව වෙන තැනක ගවයින් නොතැබිය යුතුයි.

(c) ගවයින් භාරව සිටින අය උන්ගේ කොම ඒවා නියමකර තිබෙන අදාළ ස්ථානයකට ඉවත්කරවා තමාගේ ගවයන් ඉන්නාතැන සෑමවිටම පවිත්‍රකර තබාගත යුතුයි.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කබඩ්සිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ (c) ලැගුම්භූමිය භාර සනීපාරක්ෂක නිලධාරීතුමා විසින් හෝ වෛද්‍ය නිලධාරීතුමා විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

8. මඩගලායය පවත්වන කාලයතුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැණුනහිනම් වන්දනාකාරයින්ට වන්දනා භූමියෙන් පිටවී යන්නටද, පිටවී යන මාර්ග සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (a) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය භාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතුමාට හෝ වෛද්‍ය නිලධාරීතුමාට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමිය තුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්ගෙයක්, හෝ සිසිල්බීම සාදන ස්ථානයක් හෝ තේපැන්සාලාවක් හෝ කෝපි කඩයක් හෝ බත්කඩයක් හෝ ගාලක් තැනීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ එබඳු ස්ථානයක් තබාගතයුතු නොවේ. බලපත්‍රය නොමිළයේ දෙනුලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් වීදියකින් අසුවනසේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැකැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ එතුමාගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම්භූමිය තුළ කිසිවකු විසින් සතෙක් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතෙක් මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

### උප ලේඛනය.

**තලවිල ලැගුම්භූමියේ සීමා.**

උතුරට තලවිලමීබෙඩ්සි; දකුණට ඒතාලේ තලවිල සහ තේලි කුඩාතලවිල පාරවල් එරුම්බුකුඩල් හන්දියේ සිට කෙළින් බස්නාහිර අතට මුහුදට යන පාර; නැගෙනහිරට පාණ්ඩාරම් කරුක්කුවච්චම් පෙරියකෝට්ටම් පාරවල්; බස්නාහිරට මුහුද.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පිගන් ආදී මැටිභාජන කර්මාන්තශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,447. ගම—පෙරියමුල්ල, 3වෙනි කොට්ඨාශය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මනන; අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 1 | කුරුඳුගහවත්ත, මගුල්කරදගහ වත්ත සහ ගොරකගහවත්ත, නොහොත් මෝලෙවත්ත, 4වෙනි වෝඩ් එකේ වරිපනම් නො.42, (නො.3 කොට්ඨාශය) | අවුරුදු 40ක් වයස පොල්ගස් 101ක්ද, අවුරුදු 4–20 වයස පොල්ගස් 121ක්ද, අවුරුදු 3ක් වයස පැණි දොඩන්ගස් 3ක්ද, අවුරුදු 3ක් වයස දොඩංගස් 2ක්ද, අවුරුදු 6ක් වයස කජුගස් 2ක්ද, අවුරුදු 3ක් වයස අඹගස් 2ක්ද, අවුරුදු 15ක කොහොඹගහක්ද; කෙසෙල්පඳුරු 73ක්ද, ගොඩනැගිලි 11ක්ද (සින් නහඹු සෙවිලිකල කපරාරුකල ෆැක්ටරිය, උළු සෙවිලිමේසන්වැඩකල ගෙයක්ගොඩිස) තාවකාලික ගොඩනැගිල්ලක්ද, කාක්කූස්සි 4ක්ද; කපරාරුකල ළිඳක්ද, ඉදිරිපස තාප්පයක් ඇති කපරාරුකල ළිඳක්ද, කපරාරුකල වැන්කියක්ද, සින්ක්නහඹු වැන්කි ඇති මේසන්වැඩකල ඕලොක් එකක්ද; සින්ක්නහඹු වැන්කි සමීකර තිබෙන කපරාරුකල කුළුනක්ද; මේසන්වැඩකල කුළුණක්ද; ගල්අල්ලනලද බිම්කොටස් 2ක්ද, සිමෙන්ති අල්ලනලද බිම්කොටසක්ද, විදුලිකණු 4ක්ද; කපරාරුකල ආවරණයක්ද, කපරාරුකල කාණු සහ දියවලවල්ද, අත්කරතත පාරවල්ද, සසිලන්සර් එක තිබෙන කපරාරුකල වලක්ද, ගඩොල් පෝරණු 8ක්ද, සින්ක්නහඹු වැටක්ද; කපරාරුකල කණු 4ක් ඇති ලී සහ යකඩ ගේට්ටු 2ක්ද; කම්බි වැටවල්ද, පිප්ප තැබීම පිණිස කපරාරුකල බැම්මක්ද; බලංසය සමීකර තිබෙන යකඩ කණුද, ගඩොල් බිම්තියක්ද ඇති පොල් ඉඩම | ජේ. එම්. වැවෂියර් සහ සමාගම, බින්ස් පාර, කොළඹ | 6 0 32·9 |
| 2 | කුරුඳුගහවත්ත, මගුල්කරදගහ වත්ත සහ ගොරකගහවත්ත නොහොත් මෝලෙවත්ත, 4වෙනි වෝඩ් එකේ වරිපනම් නො. 42A; නො.3 කොට්ඨාශය | අවුරුදු 40ක් වයස පොල්ගස් 6ක්ද, අවුරුදු 20ක් වයස කොස්ගහක්ද, අවුරුදු 3 සහ 5 අඹගස් 2ක්ද, අවුරුදු 8ක් වයස බෙලිගහක්ද, කෙසෙල්පඳුරු 50ක්ද, සිමෙන්ති දමනලද බිමක් ඇති ගොඩනැගිල්ලක්ද, කාක්කූස්සි 2ක්ද, කපරාරුකල ළිං 2ක්ද, සිමෙන්ති බාල්දි 2ක්ද, කපරාරුකල කාණුවක්ද, තාප්පයක්ද; පැලඹුහි වැටක්ද ඇති පොල් ඉඩම | එම .. | 0 1 16·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ මාර්තු මස 20වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරකම් තොරතුරුත් කියාසිටින්ම ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ පෙබරවාරි මස 24වෙනි දින
කොළඹ කච්චේරියේදිය.

ඩබ්ලිව්. ඒ. හෝබ්ස්.
බ. ප. ආණ්ඩුවේ ඒජන්තවරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:— අම්බගහ පලාතේ පාරක උවමනාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක ඇමැති මණ්ඩලයෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

අතුරු සිතියම 1, අවසාන සිතියමේ නො. 606. ගම—පොල්ගහවිල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මනන, අ. රූ. පැ. |
|---|---|---|---|---|
| 300 | වතුගහඉන්නදෙන්න නොහොත් ගොනතිප්පොලවත්ත | අවුරුදු 21ක්වූ රබර්ගස් 20ක් තිබේ | ජී. ඒ. ජයවර්ධන මහතා, වෝඩ් ප්ලේස්, කොළඹ | 0 0 22·1 |
| 301 | පාර .. | ගම්සභාපාරේ කොටසක්, අවුරුදු 20ක්වූ තේගස් 17ක් තිබේ | එම .. | 0 0 16·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1942ක්වූ මාර්තු මස 21වෙනි දින පෙරවරු 11.30ට හෝ සකියමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරකම් තොරතුරුත් කියාසිටින්ම ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ පෙබරවාරි මස 13වෙනි දින
ගාල්ලේ කච්චේරියේදිය.

ඩී. ජී. ඇල්. මිසෝ,
ආණ්ඩුවේ උප ඒජන්තවරයා.

---

## අන්‍ය දැන්වීමයි.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම්කෝරලේ අදිකාරිපත්තුවේ බණ්ඩාරගම පදිංචි විල්සන් මහම්පේජී වන මම කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූපසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කර සිටින බව වර්ෂ 1907යේ අංක 1 දරණ ආඥාපණතේ 1කි දරණ උප ලෙඛණයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දන්වමි.

බණ්ඩාරගම,
20 පෙබරවාරි, 1942.

ඩබ්ලිව්. මහම්පේජී.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.